**කම්කරු අමාත්‍යාංශය**

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය**

# තනතුරු පුරප්පාඩු

කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිත හා 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත යටතේ ස්ථාපිත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පුරප්පාඩු පවතින අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ ජනරාල් :

**1.1 පත්වීමේ ස්වභාවය**

I. **සේවා ගණය** : **ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

ii. **වැටුප් කේතය** : HM-2-1-2025

iii. **වැටුප් පරිමාණය** : **රු. 161,140 – 12 X 4,850 – 219,340**

**1.2 බඳවා ගැනීමේ සුදුසුකම් :**

**1.2.1 අධ්‍යාපන** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන සුදුසුකම්**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෛද්‍ය, ඉංජිනේරු, වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය, ශ්‍රම විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කළමනාකරණ, වාණිජවේදී හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

උක්ත ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 17ක පළපුරුද්දක් (මින් වසර 05 ක් වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති පරිචයෙහි පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය, ඉංජිනේරු, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය, ශ්‍රම විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කළමනාකරණ, වාණිජවේදී, පරිසර විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

ii. උක්ත ක්ෂේත්‍රයන්ට අදාළව ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

iii. උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන සුදුසුකම්**

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 02 ක අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සමග**

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාවක් ලබා තිබීම.

**1.2.2 වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**1.2.3 වෙනත්** : සෑම ඉල්ලුම්කරුවෙකුම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**1.3. බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

### සේවා නියුක්ත කරවීමේ කොන්දේසි

මෙම පත්වීම ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

### බඳවා ගැනීමේ දී වැටුප

බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමේ දී අදාළ තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### අයදුම් කිරීමේ ක්‍රමය

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත 2026.03.23 දිනට හෝ ඊට පෙර සභාපති, පාලක මණ්ඩලය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, අංක 97, ජාවත්ත පාර , කොළඹ 05 ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කළ යුතුය.

අයදුම්පත බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙලවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසු ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය

තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.03.23 දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් අවසාන තීරණය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පාලක මණ්ඩලය සතු වේ.

**දුරකථන අංකය** :- 011- 2585425 / 011 – 2598672

**විද්‍යුත් තැපෑල** :- info@niosh.gov.lk

**වෙබ් අඩවිය** :- www.niosh.gov.lk

**ලිපිනය :-** **සභාපති,**
**පාලක මණ්ඩලය,**
**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය,**
**අංක 97, ජාවත්ත පාර,**
**කොළඹ 05.**